# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2326/16 - 2023 අප්‍රේල් මස 03 වැනි සඳුදා - 2023.04.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 6/2017

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත**

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 26, 31(ඈ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) වන වගන්ති සමග කියවිය යුතු ඒ පනතේ 117(2)(ට) වන වගන්තිය යටතේ වරාය, නාවික සහ ගුවන්සේවා අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**නිමල් සිරිපාල ද සිල්වා,**
වරාය, නාවික සහ ගුවන්
සේවා අමාත්‍ය.

2023 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

01. මේ නියෝග 2023 අංක 01 දරන සිවිල් ගුවන් සේවා ගගන නාවික සේවා (ගුවන් සංතරණ සහ ගුවන් සේවා ආරක්ෂක) සැපයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. (1) මෙහි 3 වන නියෝගයේ සඳහන් කරන ලද අදාළ සේවාවක් සම්බන්ධයෙන් (මෙහි මින්මතු ''අධ්‍යක්ෂ-ජනරාල්වරයා'' යනුවෙන් සඳහන් කරනු ලබන) සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ගගන නාවික සේවා (ගුවන් සංතරණ) සැපයීම සඳහා වූ වලංගු බලපත්‍රයක් නොමැතිව, කිසිදු තැනැත්තකු විසින්, කලාපීය ගුවන් සංතරණය ගිවිසුම් යටතේ ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානය විසින්, ශ්‍රී ලංකාව වෙනුවෙන් වෙන් කළ ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය හෝ සාගරික අවකාශය තුළ මෙහි 3 වන නියෝගයේ (අ) සිට (ඈ) ඡේදවල සඳහන් කරන ලද ගුවන් සංතරණ කටයුතුවලට අදාළ යම් ගගන නාවික සේවාවක් සැපයීම නොකළ යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ගගන නාවික සේවා (ගුවන් සේවා ආරක්ෂක) සැපයීම සඳහා වූ වලංගු බලපත්‍රයක් නොමැතිව, කිසිදු තැනැත්තකු විසින්, ගගන නාවික සේවා ස්ථාපනය කරන ලද ගගන යාත්‍රාංග නයක සීමා තුළ හෝ වෙනත් යම් ප්‍රදේශයක හෝ ස්ථානයක, මෙහි 3 වන නියෝගයේ (ඉ) ඡේදයෙහි සඳහන් ගගන නාවික සේවාවක් සැපයීම නොකළ යුතු ය.

03. (අ) ගුවන් ගමන් සේවා;
(ආ) ගගන නාවික තොරතුරු සේවා;
(ඇ) ගගන නාවික සංදේශන සේවා;
(ඈ) සංදේශනය, ගුවන් සංතරණය සහ සෝදිසිය සඳහා ගගන නාවික ආධාරක; සහ
(ඉ) ගුවන් සේවා ආරක්ෂක සේවා,

යන ගගන නාවික සේවා සැපයීමට අදහස් කරන සෑම සේවා සැපයුම්කරුවකු විසින් ම බලපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය වන යම් තොරතුරු ද සමග පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියකින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉල්ලුම් කරනු ලැබිය යුතු ය.

4. 3 වන නියෝගයේ සඳහන් කරන ලද යම් බලපත්‍රයක් සඳහා ඉල්ලුම් කරන සෑම සේවා සැපයුම්කරුවකු ම -

(අ) යෝජිත සේවා සැපයීම සඳහා අමාත්‍යවරයා විසින් යථා පරිදි පත් කරන ලද සේවා සැපයුම්කරුවකු විය යුතු ය;

(ආ) සතුව, අදහස් කරන ලද සේවා සැපයීමේ දී සත්‍ය වශයෙන් ම කළ පැවරීම් සහ අනාගත පැවරීම් සම්පූර්ණ කිරීමට අවශ්‍ය මූල්‍ය සම්පත් තිබිය යුතු ය;

(ඇ) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිර්ණය කරනු ලැබුවා වූ මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවල දැක්වෙන පරිදි සංවිධාන, කාර්ය මණ්ඩල, උපකරණ, ලිඛිත ක්‍රියාපටිපාටි, පහසුකම් සහ සේවා යන සුදුසු යෝග්‍යතා සපුරාලීමෙන් ලද ගුවන් සංතරණ හෝ ගුවන් සේවා ආරක්ෂක සේවාවලට අදාළ ගගන නාවික සේවා සැපයීම සඳහා වූ යෝග්‍යතා සහතිකයක් සතු තැනැත්තකු විය යුතු ය;

(ඈ) නිරුපද්‍රිතතාව හෝ ආරක්ෂාව පිළිබඳ යම් ගුවන් සංතරණ නියමයක් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වරදකරුවකු කරනු ලැබ නොතිබිය යුතු ය; සහ

(ඉ) බලපත්‍රය යටතේ ඉටු කරන කාර්යයන්ගෙන් පැනනැගිය හැකි සිය වගකීම් ප්‍රමාණවත් පරිදි ආවරණය කරන වලංගු වගකීම් රක්ෂණයක් සතු තැනැත්තකු විය යුතු ය.

05. කාණ්ඩ දෙකක් හෝ ඊට වැඩි ගණනක් සඳහා බලපත්‍ර ලබාගැනීමට අදහස් කරන සේවා සැපයුම්කරුවකු විසින් එක් එක් බලපත්‍ර කාණ්ඩය සඳහා ඉල්ලුම්පත්‍ර වෙන් වෙන්ව ඉදිරිපත් කළ යුතු ය.

06. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරුවකු සැපයීමට බලාපොරොත්තු වන එක් එක් ගගන නාවික සේවා සම්බන්ධයෙන් එම තැනැත්තාව වෙන් වෙන් ව තක්සේරු කිරීමකට ලක් කළ යුතු ය. අදාළ ප්‍රමිතිවලට, නිර්දේශිත පරිචයන්ට සහ කර්මාන්තයේ හොඳම පරිචයන්ට අනුකූලව ගුවන් සංතරණ හෝ ගුවන් සේවා ආරක්ෂක සේවාවලට අදාළ ගගන නාවික සේවාව සැපයීම සඳහා ඉල්ලුම්කරුගේ යෝග්‍යතාවය ඒ තක්සේරු කිරීම් මගින් ඇගයිය යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, නියමිත තක්සේරු කිරීම සතුටු දායක ලෙස සම්පූර්ණ කර ඇති එක් එක් බලපත්‍ර කාණ්ඩය සඳහා ගගන නාවික සේවා සහතික වෙන වෙනම නිකුත් කරනු ලැබිය හැකි ය.

(3) 2 වන නියෝගයේ සඳහන් කරන ලද බලපත්‍රයක් සඳහා ඉල්ලුම්කරුවකු, ගගන නාවික සේවා සැපයුම්කරු බලපත්‍රයක් නිකුත් කරනු ලැබීම සඳහා සුදුසු වීමට, වලංගු ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකයක් දැරිය යුතු ය.

(4) ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකය, එය නිකුත් කළ දින සිට වසර දෙකක කාල සීමාවක් සඳහා වලංගු විය යුතු අතර ඒ සහතිකයේ නිශ්චිතව දක්වා ඇති කොන්දේසිවලට යටත් විය යුතු ය.

(5) සහතිකයේ මූලික කොන්දේසි අඛණ්ඩව පිළිපැදීමට අනුකූලවීමට යටත්ව ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකයේ වලංගු කාලසීමාව වසර දෙකක කාලසීමාවක් සඳහා අලුත් කරනු ලැබිය හැකි ය.

(6) සහතිකයක් මූලිකව නිකුත් කිරීම, අලුත් කිරීම සහ සංශෝධනය කිරීම සඳහා වූ ගාස්තු, (මෙහි මින්මතු ''ගාස්තු සහ අයකිරීම් නියෝග'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2014 ජූලි මස 2 වන දින සහ අංක 1869/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2014 අංක 1 දරන සිවිල් ගුවන් සේවා අධිකාරියේ ගාස්තු සහ අයකිරීම් නියෝගවල නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(7) ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකයේ එක් එක් කාණ්ඩ නිකුත් කිරීම සඳහා සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා මෙහි දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

07. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, එවැනි ඉල්ලුම්පත්‍රයක් ලැබී දින එකසිය විස්සක කාල සීමාවක් තුළ දී එහි සපයන ලද තොරතුරු පිළිබඳව සහ අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවල නිශ්චිතව දක්වන ලද අදාළ අවශ්‍යතාවලට අනුකූලවීමට ඉල්ලුම්කරු සතු යෝග්‍යතාව, සුදුසුකම් සහ හැකියාව පිළිබඳ සෑහීමට පත් වෙමින් -

(අ) ගාස්තු සහ අයකිරීම් නියෝගවල නිශ්චිතව දක්වා ඇති මූලික ගාස්තු ගෙවීමෙන් පසුව එකී සේවා සැපයුම්කරුට අදාළ කාණ්ඩය සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකිය; නැතහොත්

(ආ) හේතු දක්වා බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

08. එසේ නිකුත් කරන ලද එවැනි සෑම බලපත්‍රයක්ම -

(අ) නිකුත් කරන දින සිට මෙහි 9 වන නියෝගයේ නිශ්චිතව දක්වා ඇති පරිදි එය අත්හිටුවන තෙක් හෝ අවලංගු කරන තෙක් වලංගු විය යුතු ය;

(ආ) මෙහි සිව්වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියේ විය යුතු ය;

(ඇ) මෙහි තුන්වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් නියම සහ කොන්දේසිවලට යටත් විය යුතු ය

(ඈ) වාර්ෂික ගාස්තුවකට යටත් විය යුතු ය.

09. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 26 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති හේතුවලට අමතරව පහත දැක්වෙන හේතු, එනම් -

(අ) බලපත්‍රයෙන් යටත් කරන ලද යම් නියම සහ කොන්දේසි උල්ලංඝනය කිරීම;

(ආ) මෙහි දෙවන උපලේඛනයේ සඳහන් කරනු ලැබුවා වූ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවල නිශ්චිතව දක්වා ඇති යෝග්‍යතා සහතිකයේ වලංගුතාව සඳහා අදාළ වන, ගගන නාවික සේවාවල නිරුපද්‍රිතතාව, කාර්යක්ෂමතාවය හෝ විධිමත්භාවය සම්බන්ධයෙන් නිශ්චිතව දක්වන ලද ප්‍රමිතීන් සෑහීමකට පත්වන පරිදි පවත්වාගෙන නොයෑම;

(ඇ) අදාළ ගගන නාවික සේවාව සැපයීම සඳහා නිකුත් කරන ලද යෝග්‍යතා සහතිකයේ වලංගු කාලසීමාව ඉකුත් වීම, යන හේතු මත ගගන නාවික සේවා සැපයුම් බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(2) බලපත්‍රයක් අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට පෙරාතුව, අධ්‍යක්ෂ-ජනරාල්වරා විසින්, බලපත්‍රලාභියාට බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම පිළිබඳව ලිඛිත දැන්වීමක් කළ යුතු අතර බලපත්‍රය අත්හිටුවීම හෝ අවලංගු කිරීම නොකළ යුත්තේ මන්ද යන්නට ලිඛිතව හේතු දැක්වීමට ඔහුට සාධාරණ කාල සීමාවක් ලබා දිය යුතු ය. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, යම් අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක් පිළිබඳ තීරණය කිරීමට පෙරාතුව බලපත්‍රලාභියා විසින් යවන ලද හේතු සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

(3) (2) වන ඡේදයේ කුමක් සඳහන් වුව ද, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, එවැනි බලපත්‍රයක් යටතේ සපයනු ලබන සේවාවල නිරුපද්‍රිතතාව පිළිබඳ බරපතල ලෙස සැක අති වී තිබෙන්නේ නම්, එවිට, බලපත්‍රය අත්හිටුවනු ලැබිය හැක.

(4) අත්හිටුවන ලද හෝ අවලංගු කරන ලද ගගන නාවික සේවා සැපයුම්කරු බලපත්‍රය දරන්නා විසින්, එකී බලපත්‍රය නොපමාව, සුදුසු පිටසනක් යෙදීම පිණිස අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) බලපත්‍රය අවලංගු කරනු ලැබ ඇති ගගන නාවික සේවා සැපයුම්කරු බලපත්‍රය දරන්නා විසින්, නොපමාව, සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් බලපත්‍රලාභියාට ලබා දී ඇති සියලු වත්කම් සහ දේපළ එකී අධිකාරියට බාරදිය යුතු ය.

10. බලපත්‍රලාභියකු විසින් ස්වකීය කැමැත්ත අනුව, ඔහු වෙත නිකුත් කරන ලද බලපත්‍රය යටතේ පවරන ලද සේවා සැපයීම අවසන් කිරීමට අදහස් කරන අවස්ථාවක දී, එකී බලපත්‍රලාභියා විසින් ඒ පිළිබඳව එකී සේවා සැපයීම අවසන් කිරීමට අදහස් කරන ලද දිනයට අවම වශයෙන් දින එකසිය අසූවකට පෙරාතුව ලිඛිත දැන්වීමක් කළ යුතු අතර, බලපත්‍රය අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත බාර දී බලපත්‍රලාභියා වෙත නිකුත් කරන ලද සියලු වත්කම් සහ දේපළ බලපත්‍රය බාර දෙන දින සිට හෝ එදිනට පෙර අධිකාරිය වෙත ආපසු බාරදෙනු ලැබිය යුතු ය.

11. ඉහත නියෝගවල පටහැනිව කුමක් සඳහන් වුව ද, 7 වන නියෝගය යටතේ නිකුත් කරන ලද ගගන නාවික සේවා සැපයුම්කරු බලපත්‍රයේ වලංගුභාවය :-

(අ) පහත කරුණු සම්බන්ධයෙන් කරන ලද වෙනසක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දී ඔහුගේ ලිඛිත අනුමතය ලබා ගැනීමෙන් තොරව සිදු කර ඇත්නම්, එනම්,

(i) බලපත්‍රලාභියාගේ අයිතිය වෙනස් කිරීම;

(ii) බලපත්‍රලාභියාගේ ව්‍යාපාර නාමය වෙනස් කිරීම;

(iii) බලපත්‍රලාභියාගේ සාංගමික සංස්ථාපත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් වීම;

(iv) ගගන නාවික සේවා සැපයීම සඳහා භාවිතා කළ උපකරණවල, පහසුකම්වල, ක්‍රියාපටිපාටිවල හෝ සේවාවල සැලකිය යුතු වෙනසක් වීම;

(v) බලපත්‍රලාභියා සම්බන්ධයෙන් වගකිව යුතු කළමනාකරු වෙනස් වීම ; සහ

(vi) බලපත්‍රලාභියා නම් කළ තනතුරු දරන්නන් වෙනස් වීම,

(ආ) යෝග්‍යතා සහතිකයේ වලංගුතාවය සඳහා අවශ්‍ය වන්නා වූ, අදාළ ගගන නාවික සේවාවල නිරුපද්‍රිතතාව, ආරක්ෂාව, කාර්යක්ෂමතාව සහ විධිමත් බව හා සම්බන්ධ ප්‍රමිති පවත්වාගෙන යාම ප්‍රමාණවත් නොවේ නම්,

වහාම ක්‍රියාත්මක වන සේ අවලංගු විය යුතු ය.

12. මේ නියෝගවල කාර්ය සඳහා -

''වගකිවයුතු කළමනාකරු'' යනුවෙන්, අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවල අවශ්‍යතාවලට අනුකූලව ගගන නාවික සේවා සැපයීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඍජුව වගකිව යුතු නම් කළ තැනැත්තකු අදහස් වේ;

''ගගන නාවික සේවා'' යනුවෙන්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 31 වන වගන්තිය යටතේ සඳහන් කරන ලද සේවාවන් අදහස් වේ;

''යෝග්‍යතා සහතිකය'' යන්නෙන්, මෙහෙයුම් පිරිවිතරවල නිශ්චිතව දක්වා ඇති පරිදි ගගන නාවික සැපයීමේ කාර්යය සඳහා අවශ්‍ය කරන දක්ෂතාව, සාමාර්ථය සහ ශක්නුතාව ඇතුළුව ඔහුට පවරන ලද වැඩ කොටස ඉටු කිරීමට බලපත්‍රය දරන්නාට හැකියාව තිබෙන බවට සහතික කරමින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත්කරන ලද සහතිකයක් අදහස් වේ;

''අධ්‍යක්ෂ-ජනරාල්වරයා'' යන්නෙන්, 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය පනතේ 11 වන වගන්තිය යටතේ පත් කරන ලද සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ-ජනරාල්වරයා අදහස් වේ;

''මෙහෙයුම් පිරිවිතර'' යන්නෙන්, සේවා සැපයුම්කරුවන්ගේ කටයුතුවල ස්වභාවය සහ විෂය පථය සහ මෙහෙයුම් උපක්‍රම හා ආකාරය නිශ්චිතව දක්වන ලේඛනය අදහස් වේ;

''නම් කළ තනතුරුලාභියා'' යනුවෙන්, සේවා සැපයුම්කරුවකු විසින් ගගන නාවික සේවා සැපයීමේ දී ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවලට අනුකූල බව සහතික කරමින් වගකිව යුතු කළමනාකරු වෙත වගකියනු ලබන තැනැත්තකු අදහස් වේ;

''සේවා සැපයුම්කරුවා'' යන්නෙන්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන වගන්තිය යටතේ පත් කරන ලද සේවා සැපයුම්කරුවකු අදහස් වේ;

''ශ්‍රී ලංකා භූමි ප්‍රදේශය'' යනුවෙන්, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 124 වන වගන්තිය යටතේ ඊට දී ඇති අර්ථයම ම තිබිය යුතු ය.

## පළමුවන උපලේඛනය

***ගගන නාවික සේවා සැපයීම සඳහා වන බලපත්‍රය - අයදුම්පත්‍රය***

*සටහන - යම් කාණ්ඩ දෙකක් හෝ ඊට වැඩි කාණ්ඩයන් සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන අයදුම්කරුවෙකු ඒ එක් එක් කාණ්ඩයන් සඳහා වෙනම අයදුම්පත්‍රයන් ඉදිරිපත් කළ යුතුය.*

| *අ. ගගන නාවික සේවා වර්ගය, කරුණාකර එක් කාණ්ඩයක් ඉදිරියේ '' ✔ '' ලකුණ යොදන්න* | | |
|---|---|---|
| (අ) | ගුවන් ගමන් සේවා | |
| (ආ) | ගගන නාවික තොරතුරු සේවා | |
| (ඇ) | ගගන නාවික සංදේශන සේවා | |
| (ඈ) | සංදේශනය, ගුවන් සංතරණය සහ සෝදිසිය සඳහා ගගන නාවික ආධාරක | |
| (ඉ) | ගුවන් සේවා ආරක්ෂක සේවා | |

| *ආ. අයදුම්කරුගේ විස්තර* | | | | | |
|---|---|---|---|---|---|
| 1. | ආයතනයේ නම | | | | |
| 2. | ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය | | | | |
| 3. | දුරකථන | | 4. | ෆැක්ස් | |
| 5. | විද්‍යුත් තැපැල | | | | |

| *ඇ. ගගන නාවික සේවා සැපයුම්කරුවෙකු ලෙස පත් වීමට අදාළ විස්තර* | | |
|---|---|---|
| 1. | නියෝග අනුක්‍රමික අංකය | |
| 2. | ගැසට් පත්‍රය ප්‍රකාශිත දිනය | |

| *ඈ. වගකිව යුතු කළමනාකරුගේ විස්තර* | | | | | |
|---|---|---|---|---|---|
| 1. | නම : (මහතා/මහත්මිය) | | | | |
| 2. | තනතුර/නිල නාමය | | | | |
| 3. | දුරකථන | | 4. | ෆැක්ස් | |
| 5. | විද්‍යුත් තැපැල | | | | |

| *ඉ. නම්කළ තනතුරු ලාභියාගේ විස්තර* | | | | | |
|---|---|---|---|---|---|
| 1. | නම : (මහතා/මහත්මිය) | | | | |
| 2. | තනතුර/නිල නාමය | | | | |
| 3. | දුරකථන | | 4. | ෆැක්ස් | |
| 5. | විද්‍යුත් තැපැල | | | | |

| ඊ. ඉදිරිපත් කළ යුතු ලේඛන පිළිබඳ විස්තර | | | |
|---|---|---|---|
| අයදුම්කරු විසින් අයදුම්පත්‍රය පහත දක්වෙන ලේඛන වල සහතික පිටපතක් සහ ආවරණ ලිපියක් ද සමග මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමට අවම වශයෙන් දින 120 කට ප්‍රථම සිවිල් ගුවන්සේවා අධිකාරිය වෙත භාර දිය යුතුය. | | | |
| # | ලේඛන | ඔව් | නැත |
| 01 | ගැසට් පත්‍රයේ ප්‍රකාශිත අමාත්‍යවරයාගේ නියෝගය | | |
| 02 | අදහස් කරන ලද සේවා සැපයීමේදී සත්‍ය වශයෙන්ම කළ පැවරීම් සහ අනාගත පැවරීම් සම්පූර්ණ කිරීමට පවතින මූල්‍ය සම්පත් පිළිබඳ විස්තරය | | |
| 03 | අදාළ බලපත්‍රය යටතේ කාර්යයන් ඉටු කිරීමේදී පැන නැගිය හැකි වගකීම් ප්‍රමාණවත් පරිදි ආවරණය කිරීමට හැකි වලංගු වගකීම් රක්ෂණයේ විස්තරය | | |
| 04 | අදාළ ආනුෂංගික ලේඛන සමග වගකිව යුතු කළමනාකරුගේ ජීව දත්ත පත්‍රිකාව | | |
| 05 | අදාළ ආනුෂංගික ලේඛන සමග නම් කළ තනතුරුලාභියාගේ ජීව දත්ත පත්‍රිකාව | | |
| 06 | අයදුම්කරු යම් ගුවන් නිරුපද්‍රිතතා හෝ ආරක්ෂක අවශ්‍යතාවයක් උල්ලංඝණය කිරීමකට අදාළව වරදකරු වී ඇත්නම් ඊට අදාළ ආනුෂංගික ලේඛන සමග වන විස්තර | | |
| 07 | සිවිල් ගුවන්සේවා අධිකාරිය මගින් පනවා ඇති ගාස්තු සහ අය කිරීම් වලට අනුව පිරිසැකසුම සඳහා අදාළ මූලික ගාස්තුව | | |

| උ. ප්‍රකාශය | | | |
|---|---|---|---|
| මා විසින් මෙහි ''අ'' කොටසේ දක්වා ඇති ගගන නාවික සේවාව සැපයීම සඳහා වන බලපත්‍රයක්, මෙම අයදුම්පත්‍රයේ ''ආ'' කොටසේ නිශ්චිතව දක්වා ඇති අයදුම්කරු වෙනුවෙන් අයදුම්කරන බවත්, මෙම අයදුම්පත්‍රයේ සහ ආනුෂංගික ලේඛන සියල්ලෙහි දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවටත් සහතික කරමි. | | | |
| නම : (මහතා/මහත්මිය) | | | |
| තනතුර/නිල නාමය | | | |
| දුරකථන | | ෆැක්ස් | |
| විද්‍යුත් තැපැල | | | |
| අත්සන | | දිනය | |

**දෙවන උපලේඛනය**

ගුවන් සංතරණ සේවා සහ ගුවන් සේවා ආරක්ෂක සේවා සම්බන්ධයෙන් ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකය ලබා ගැනීමට සපුරා ලිය යුතු අවශ්‍යතා

**ගුවන් ගමන් සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන, ගුවන් ගමන් සේවා සම්බන්ධයෙන් වූ ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකයක් ප්‍රදානය කිරීම සඳහා අවශ්‍යතා**

ඉල්ලුම්කරුවකු, මෙම නියෝගවල ඇතුළත් පොදු අවශ්‍යතාවලට අනුකූලවීමට අමතරව 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 120 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ගුවන් ගමන් සේවාවලට අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්වල නිශ්චිතව සඳහන් කර ඇති අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

**ගගන නාවික තොරතුරු සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන, ගගන නාවික තොරතුරු සේවා සම්බන්ධයෙන් වූ ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකයක් ප්‍රදානය කිරීම සඳහා අවශ්‍යතා**

ඉල්ලුම්කරුවකු, මෙම නියෝගවල ඇතුළත් පොදු අවශ්‍යතාවලට අනුකූලවීමට අමතරව 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 120 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ගගන නාවික සේවා තොරතුරුවලට අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්වල නිශ්චිතව දක්වා ඇති අදාළ අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

**ගගන නාවික සංදේශන සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන, ගගන නාවික සංදේශන සේවා සම්බන්ධයෙන් වූ ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකය ප්‍රදානය කිරීම සඳහා අවශ්‍යතා**

ඉල්ලුම්කරුවකු, මෙම නියෝගවල ඇතුළත් පොදු අවශ්‍යතාවලට අනුකූලවීමට අමතරව 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 120 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ගගන නාවික සංදේශන සේවාවලට අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතීන්වල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

**සංදේශනය, ගුවන් සංතරණය සහ සෝදිසිය සඳහා ගගන නාවික ආධාරක සැපයුම්කරු යෝග්‍යතා සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන, සංදේශනය, ගුවන් සංතරණය සහ සෝදිසිය සඳහා ගගන නාවික ආධාරක සම්බන්ධයෙන් වූ ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකය ප්‍රදානය කිරීම සඳහා අවශ්‍යතා.**

ඉල්ලුම්කරුවකු, මෙම නියෝගවල ඇතුළත් පොදු අවශ්‍යතාවලට අනුකූල වීමට අමතරව 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 120 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද සංදේශනය, ගුවන් සංතරණය සහ සෝදිසිය සඳහා ගගන නාවික ආධාරක සැපයීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

**ගුවන් සේවා ආරක්ෂක සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකය යනුවෙන් හඳුන්වනු ලබන ගුවන් සේවා ආරක්ෂක සේවා සම්බන්ධයෙන් වූ ගගන නාවික සේවා සැපයුම්කරු යෝග්‍යතා සහතිකය ප්‍රදානය කිරීම සඳහා අවශ්‍යතා**

ඉල්ලුම්කරුවකු, මෙම නියෝගවල ඇතුළත් පොදු අවශ්‍යතාවලට අනුකූලවීමට අමතරව, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 120 වන වගන්තිය ප්‍රකාරව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද ගුවන් සේවා ආරක්ෂක සේවා සැපයීමට අදාළ ක්‍රියාත්මක කිරීමේ ප්‍රමිතිවල නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවලට අනුකූල විය යුතු ය.

## තුන්වන උපලේඛනය

### *(අ) නියම හා කොන්දේසි*

1. සෑම බලපත්‍රලාභියකු විසින් ම, එකී බලපත්‍රය නිකුත් කරන ලද්දේ යම් සේවාවක් සැපයීම සම්බන්ධයෙන් ද, එකී සේවාව සැපයීමට අදාළව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත වගකිව යුතු වූ ''වගකිව යුතු කළමනාකරු'' යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු තැනැත්තකු කොන්ත්‍රාත් පදනම හෝ වෙනත් අයුරකින් සේවයෙහි නියුක්ත කළ යුතු ය.

2. (1) සෑම බලපත්‍රලාභියකු විසින්ම සේවයේ නියුක්ත කළ වෘත්තිකයන්ගේ ප්‍රයෝජන සහ මාර්ගෝපදේශනය සඳහා එකී වෘත්තිකයන්ගේ වගකීම් ද ඇතුළුව අදාළ ගගන නාවික සේවාව සැපයීමට අදාළ සම්පූර්ණ උපදෙස් ඇතුළත් විය යුතු මෙහෙයුම් අත් පොතක්, හෝ ආරක්ෂක වැඩසටහනක් බලපත්‍රලාභියා විසින්, අදාළ වන පරිදි, සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට සැපයිය යුතු අතර එහි අන්තර්ගතය අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අනුමතයට යටත් විය යුතු ය.

(2) සෑම බලපත්‍රලාභියකුම, අදාළ පරිදි අනුමත මෙහෙයුම් අත්පොත්වල හෝ ආරක්ෂක වැඩසටහනෙහි විධිවිධානවලට අනුකූලව එකී බලපත්‍රලාභියා විසින් සේවයේ නියුක්ත කරන ලද තැනැත්තන් විසින් ඔවුන් වෙත පවරන ලද කාර්ය සහ කර්තව්‍යය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අදාළ තැනැත්තන්ට අවශ්‍ය මූලික සහ වාරික පුහුණුව ලබා දිය යුතු අතර ඒ පුහුණුවීම්වල වාර්තා නිසි ලෙස පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(3) බලපත්‍රලාභියා විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ විධාන පරිදි, ඕනෑම වෙලාවක, මෙහෙයුම් අත්පොතේ හෝ ආරක්ෂක වැඩසටහනෙහි අවශ්‍ය කරන ප්‍රතිශෝධන, අවශ්‍ය පරිදි, සිදු කරනු ලැබිය යුතු ය.

(4) බලපත්‍රලාභියා විසින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ අනුමතයට යටත්ව මෙහෙයුම් අත්පොතේ හෝ ආරක්ෂක වැඩසටහනෙහි අන්තර්ගත තොරතුරු, යථාවත් සහ නිවැරදි තොරතුරු බවට සහතික කිරීමට හැකි වන පරිදි, අදාළ මෙහෙයුම් අත්පොත හෝ ආරක්ෂක වැඩසටහන සංශෝධනය කිරීම හෝ ප්‍රතිශෝධනය කිරීම කළ හැකි අතර අනුමත අදාළ ගගන නාවික සේවා සැපයීමට සම්බන්ධිත සියලු මෙහෙයුම් කාර්ය මණ්ඩල අතර සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් කාර්ය මණ්ඩල අතර මෙහෙයුම් අත්පොත හෝ ආරක්ෂක වැඩසටහන, අවශ්‍ය පරිදි බෙදා හරිනු ලැබිය යුතු ය.

(5) නිරුපද්‍රිතතා හෝ ආරක්ෂිත මට්ටම, අනුමත අදාළ මෙහෙයුම් අත්පොතේ හෝ ආරක්ෂක වැඩසටහනෙහි නිශ්චිතව සඳහන් කරන ලද උපදෙස්වලින් අපගමනය වන්නේ නම් එකී අපගමනය වූ උපදෙස් මෙහෙයුම් අත්පොතේ හෝ ආරක්ෂක වැඩසටහනෙහි උපදෙස්වලට වඩා ඉහළ මට්ටමක පවත්නා බවට ඔප්පු වන්නේ නම් මිස, බලපත්‍රලාභියා විසින් සේවයේ නියුක්ත කරන ලද සෑම තැනැත්තකුම මෙහෙයුම් අත්පොතේ හෝ ආරක්ෂක වැඩසටහනෙහි ඇතුළත් සිය කාර්යවලට අදාළ සියලු උපදෙස්වලට සම්පූර්ණයෙන් ම අනුකූල විය යුතු ය.

3. බලපත්‍රලාභියා විසින්, අදාළ බලපත්‍රය යටතේ බලය දෙන ලද සේවා සැපයීම සඳහා නම් කළ තනතුරු දරන්නකු ලෙස :-

(අ) මෙම නියෝග යටතේ බලපත්‍රලාභියා වෙත වූ වගකීම සහතික කරමින් තමා වෙත පවරන ලද කාර්ය සහ කර්තව්‍යය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා වගකිව යුතු;

(ආ) බලපත්‍රලාභියා වෙත වූ වගකීමට අමතරව, පත්කළ තනතුරට අදාළ කාර්ය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයාට වගකිව යුතු;

(ඇ) කාර්යන් සහ කර්තව්‍යය කාර්යක්ෂමව ඉටු කිරීමට ඔහුට හැකි කරවීම ට බලපත්‍රලාභියා විසින් අනුමත පුහුණු අත්පොතට හෝ ආරක්ෂක වැඩසටහනට අනුකූලව දෙන ලද මූලික පුහුණුව සහ වාරික පුහුණු සතුටුදායක ලෙස සම්පූර්ණ කළ යුතු;

වූ යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය,

4. සෑම බලපත්‍රලාභියකුම, අදාළ අවස්ථාවල දී. අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ එකඟත්වය සහ මාර්ගෝපදේශය මත බලපත්‍රය යටතේ බලය දෙන ලද සේවා සැපයීමේ දී රජයේ හමුදා ආයතන සමග සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

5. සෑම බලපත්‍රලාභියකුම, බලයලත් සේවා සැලසුම් කිරීමේ දී, සැපයීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී පාර්ශ්වකරුවන් සම්බන්ධීකරණය කරමින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඇති කළ සහ පිළිගත් ශ්‍රී ලංකා ගුවන් සංතරණ සැලසුම, ජාතික සිවිල් ගුවන් සේවා ආරක්ෂක වැඩසටහන, ජාතික ගගන නාවික සෝදිසි හා මුදා ගැනීමේ සැලසුම සහ ජාතික ගුවන් සේවා නිරුපද්‍රිතතා සැලසුම සමග, සුදුසු පරිදි, අනුගත විය යුතු ය.

6. බලපත්‍රලාභියා විසින්, අවශ්‍ය අවස්ථාවල දී, අදාළ නියමවලට අනුකූලව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පිළිගනු ලබන නිරුපද්‍රිත කළමනාකරණ පද්ධතියක් පිහිටුවා පවත්වාගෙන යා යුතු ය.

7. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් විධානය කර ඇතිනම් බලපත්‍රය යටතේ බලය දෙන ලද සේවාවලින් පැන නගින යම් අනාගත බරපතල හෝ අවදානම් තත්ත්වයන්ට ප්‍රමාණවත්ව විසඳුම් ලබා දිය හැකි යයි අධ්‍යක්ෂ-ජනරාල්වරයාට පිළිගත හැකි ඵලදායි හදිසි සැලසුමක් බලපත්‍රලාභියා සතුව පැවතිය යුතුය.

8. අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් විධානය කර ඇත්නම්, හුදු මිනිස් ස්වභාවය යන සාධකය සැලකිල්ලට ගනිමින් විඩාවට පත්වීම වැළැක්වීමට ප්‍රමාණවත් ආරක්ෂක පියවර ගැනීමේ අරමුණින්, ආරක්ෂිත කර්තව්‍යයන් සැපයීමේලා නිරත වී සිටින සේවකයන්ගේ රාජකාරි කාලය සහ විවේක කාලය සීමා කිරීම සඳහා වූ අනුමත සැලැස්මක් තිබිය යුතු ය. බලපත්‍රලාභියා විසින් ඒ සීමා කිරීම් එකී කාර්යවලට අදාළව අවශ්‍ය කාර්ය මණ්ඩල ප්‍රමාණය තීරණය කිරීමේ දී සැලකිල්ලට ගනු ලැබිය යුතු ය.

9. (1) බලපත්‍රලාභියාට, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නියෝග කර ඇත්නම්, ඔහු විසින් සේවයේ නියුක්ත කරන ලද කාර්ය මණ්ඩලය විසින් ගැටලුකාරී තත්ත්ව ඇති කළ හැකි මනෝවර්තික ද්‍රව්‍ය භාවිත කිරීම තහනම් කිරීම සඳහා අනුමත ප්‍රතිපත්තියක් තිබිය යුතු ය.

(2) බලපත්‍රලාභියා විසින් සේවයේ නියුක්ත කරන ලද කිසිදු තැනැත්තකු විසින් එකී ප්‍රතිපත්තිය උල්ලංඝනය නොකළ යුතු ය.

(ආ) වරප්‍රසාද

1. බලපත්‍රලාභියාට ප්‍රදානය කළ වරප්‍රසාද, අදාළ ගුවන් සංතරණ සේවා සැපයුම්කරු බලපත්‍රයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කර ඇති පරිදි විය යුතු ය.

2. කිසිදු බලපත්‍රලාභියකු විසින්, කාර්ය සහ කර්තව්‍යය ඉටු කිරීමේ දී තමාට ප්‍රදානය කරන ලද වරප්‍රසාද ඉක්මවනු නොලැබිය යුතු ය.

(ඇ) විශේෂ නියම හා කොන්දේසි

බලපත්‍රලාභියා විසින් අදාළ ගගන නාවික සේවා සැපයීමේ දී අනුකූල විය යුතු වූ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලපත්‍රලාභියාට නිශ්චිතව දක්වන ලද විශේෂිත නියම සහ කොන්දේසි ගගන නාවික සේවා බලපත්‍රයක අඩංගු විය යුතු ය.

සිව්වන උපලේඛනය

## ගගන නාවික සේවා සැපයුම්කාර බලපත්‍රය (.....................) *

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6, 10, 11, 26, 31 (ඇ), (ඉ), (ඊ), (උ) සහ (ඌ) වගන්ති සමඟ කියවිය යුතු ඒ පනතේ 117 (2) (ට) වන වගන්තිය යටතේ ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයා විසින් සාදන ලද 2023 අංක 01 දරන සිවිල් ගුවන් සේවා ගගන නාවික සේවා (ගුවන් සංතරණ සහ ගුවන් ආරක්ෂක) සැපයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ නියෝග වලට අනුව,

නිකුත් කරන ලද යෝග්‍යතා සහතිකයට අනුකූලව සහ 2023 අංක 01 දරන සිවිල් ගුවන් සේවා ගගන නාවික සේවා (ගුවන් සංතරණ සහ ගුවන් ආරක්ෂක) සැපයුම්කරුවන්ට බලපත්‍ර ලබා දීමේ නියෝගයන්හි තෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නියම සහ කොන්දේසි වලට මෙහි අනෙක් පස දක්වා ඇති වරප්‍රසාද, විශේෂ නියම සහ කොන්දේසි වලට අනුකූලව,

*"ප්‍රධාන ව්‍යාපාරික ස්ථානයේ ලිපිනය"* හි

*"බලපත්‍රය නිකුත් කරන ලද අයගේ නම"* වෙත

*"අදාළ ගගන නාවික සේවාව"* සැපයීම සඳහා

මෙම ගගන නාවික සේවා සැපයුම්කරු බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

බලපත්‍ර අංකඃ XXXX/XX/XX

මෙම බලපත්‍රය අත්හිටුවන තෙක් හෝ අවලංගු කරන තෙක් වලංගු වේ.

නිකුත් කරන ලද දිනයඃ....................

.......................................................

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ගුවන් සේවා අධිකාරිය

* ගුවන් සංතරණ හෝ ගුවන් ආරක්ෂක සේවා (අදාළ පරිදි)

# ගගන නාවික සේවා සේවා සැපයුම්කරු බලපත්‍රය

## බලපත්‍ර අංකය:.. XXXX/XX/XX

### විශේෂ කොන්දේසි

1. ............................

2. ............................

3. ............................

### වරප්‍රසාද

1. ............................

2. ............................

3. ............................

### විශේෂ නියම සහ කොන්දේසි

1. ............................

2. ............................

3. ............................

.......................................................

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ගුවන් සේවා අධිකාරිය

EOG - 04 - 0041